බාලවයස් ලිංගික අපයෝජනයක් යනු නීතියෙන් දඬුවම් හිමිවන අපරාධයක් බව නොකිවමනායි. එවැනි සිදුවීම් පිළිබඳව වාර්තා කිරීමේදී එය භාවාත්මකව හෝ සැහැල්ලුවෙන් යුතුව වාර්තා කිරීම ගැටළුවක් වන්නේ, ඒ ඔස්සේ එවැනි අපරාධයක සැබෑ බරපතළකම සමාජයට සන්නිවේදනය වන්නේද යන පැනය නිසායි.
ඊට උදාහරණ ලෙස ලංකාදීප පුවත්පතේ (06/22) පළව තිබූ මෙම පුවත දැක්විය හැක. මෙහි සිරස්තලය ඉදිරිපත්ව තිබුණේ "තේ ගෙන ගිය දියණිය අඹුකමට ගත් නරුමයා අත්අඩංගුවට" යනුවෙනි. මෙහිදී පාඨකයන් ලෙසින් අප ප්‍රශ්න කළ යුත්තේ බාලවයස් ලිංගික අපයෝජනයක් වැනි අපරාධයක් සඳහා මෙවැනි සිරස්තලයක් යෝග්‍යද යන්නයි. "අඹුකමට ගැනීම" යන පදය ඔස්සේ එය යම්තාක් දුරකට ගම්‍ය වේ යැයි යමෙකු තර්ක කළ හැක. නමුත්, සැබවින්ම මෙම අපරාධයේ බරපතළ භාවය එම සිරස්තලයෙන් ඉදිරිපත් වේ යැයි ඔබ සිතන්නේද? එසේත් නැතිනම් එම සිරස්තලයෙන් ලිංගික අපරාධයක බරපතළ කම සැහැල්ලු නොවන්නේද?
ඊට අමතරව, මෙහි සඳහන් වන දූෂණය යන යෙදුමට වඩා ලිංගික අපයෝජනය යන යෙදුම වඩාත් උචිත යැයි අපි සඳහන් කරමු. මන්දයත්, දූෂණය යන්නෙන් වින්දිතයෙකු අපවිත්‍ර වූවා යැයි හැඟීමක් ගම්‍ය කෙරෙනා බැවිනි.
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa